# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2037/16 - 2017 සැප්තැම්බර් මස 21 වැනි බ්‍රහස්පතින්දා - 2017.09.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 21/78(xv)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

27(1) වන වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය ලක්ෂ්මන් කිරිඇල්ල වන මා විසින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය සහිතව, එකී පනතේ 21 වන වගන්තිය යටතේ සාදන ලද (2016 දෙසැම්බර් 01 දින අංක 1995/26 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරනු ලැබූ නියමය මගින් අවසන් වරට සංශෝධිත) 1984 ජනවාරි 24 දින අංක 281/7 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ශ්‍රී ලංකාවේ රුහුණ විශ්වවිද්‍යාලය පිහිටුවනු ලැබූ නියමයේ උපලේඛනයේ I වන තීරයේ සඳහන් වන "තාක්ෂණ පීඨය" යන සටහනට සහ II වන තීරයේ ඊට අනුරූප සටහන්වලට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන් එම නියමයේ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

| *"I වන තීරය*<br>*පීඨය* | *II වන තීරය*<br>*අධ්‍යයන අංශ* |
|---|---|
| සම සෞඛ්‍ය විද්‍යා පීඨය | 1. හෙද විද්‍යා අධ්‍යයන අංශය<br>2. ඖෂධවේද අධ්‍යයන අංශය<br>3. වෛද්‍ය රසායානාගාර විද්‍යා අධ්‍යයන අංශය." |

ලක්ෂ්මන් කිරිඇල්ල,<br>
උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය.

2017 සැප්තැම්බර් මස 14 වැනි දින,<br>
කොළඹ දී ය.

10-99

1A - PG 3698 — 508 (2017/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*